ආයතනයේ නම : වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින්
සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ
ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර
පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : வனஜீவராசிகள் மற்றும் வன பாதுகாப்பு அமைச்சு

நிலையியற் கட்டளையின் இலக்கம் 119 (4) இன்படி விதிமுறைகளில் பொது
கணக்கு குழுவினால் வழங்கப்பட்ட அறிக்கைக்கு ஏற்ப எடுக்கப்பட்ட
நடவடிக்கைகளும் மற்றும் கௌரவ அமைச்சர் அவர்களின்
அவதானிப்புகளினதும் சமர்ப்பிப்பு

Name of the Institution : Ministry of wildlife and Forest Conservation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 183

ආයතනයේ නම : වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් හඳුනාගත් දුර්වලතා	ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
පළමු කොටස : 92.00	
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන ව පවත්වා ගෙන නැත.	හානි පාඩු ලේඛනය මේ වන විට යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/202 අනුව අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්ය සාධන වාර්තා මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධි විධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ව ඇත. එහෙත් 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් භාණ්ඩාගාර ලේකම්ගේ අංක PFD/RED/REG/02/CC/01/2021 දරන චක්‍රලේඛය මගින් කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ දිනය 2021.06.30 දිනය තෙක් දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2020 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2021.06.29 වෙනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි.	අනුමත සීමාව ඉක්මවා බඳවා ගෙන තිබූ කාර්යමණ්ඩලය, මෙම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ලෙස අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මු.රෙ. 71 යොමු කර ඇත.
දෙවන කොටස : 79.00	
ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හා ප්‍රසංශා සටහන් කිරීමට අවස්ථාව සළසා දී නොතිබුණි.	2020 වර්ෂයේ දී වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන ගිය www.msdw.gov.lk නමැති නිල වෙබ් අඩවියේ මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට ආකෘතියක් සකස් කර නොතිබුණ ද විද්‍යුත් තැපෑල මගින් එම අවස්ථාව සළසා තිබුණි. එමෙන්ම 2022 වර්ෂයේ දී www.mwfc.gov.lk නමින් මෙම අමාත්‍යාංශය වෙනුවෙන් නව නිල වෙබ් අඩවියක් නිර්මානය කර යාවත්කාලීන ව පවත්වා ගෙන යනු ලබන අතර එම වෙබ් අඩවියෙහි මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සළසා දී ඇත.

පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර නොතිබුණි.	2022 වර්ෂයේ දී පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත.
ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා අයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	2022 වර්ෂයේ දී පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර එය අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලදි.

.....

ඒ. කුමාරසිරි පෙරේරා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

කුමාරසිරි පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරී
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය
නො. 1090. ශ්‍රී ජයවර්ධනපුර මාවත,

.....

ආර්.එම්.සී.එම්. හේරත්

ලේකම්

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

ආර්.එම්.සී.එම්. හේරත
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය